

# සේනාධීර පියසේන අපට ඉතිරි කර ගියේ කුමක්ද?

**ඩී බී කුරුප්පු**

ඔහුගේ අභාවය ජාතියට පිරිමැසිය නොහැකි පාඩුවක් යයි කිව හැකිය. ඔහුට අමා මහ නිවන් සුව පැතිය හැකි ය. චාරිත්‍රාණුගත මේ වාගේ මුසා නොදොඩා මිය ගිය මහා ලේඛකයා - මහා මාධ්‍ය වේදියා අපට කියා දුන් - ක්‍රියාවෙන් හා ආදර්ශයෙන් - අප ඔහුගෙන් උගත යුතුව තිබූ පාඩම් - මග පෙන්වීම් කවරේදැයි විමසා බැලීම ඔහුටත් ජනතාවටත් කරන මහගුම සේවය බව මට සිතෙයි.

අවුරුදු දොළහක පමණ සිසුවකු හැටියට ආනන්ද විද්‍යාලයේ නේවාසිකයන් පළ කළ ASOKIAN නම් පුවත්පතේ සම සංස්කාරක (අනෙක් සංස්කාරක සී එම් වීරරත්න ය) වශයෙන් මාධ්‍යයට පිවිසුණු එස් පියසේන 94 වියක් ආයු වළඳා අවසන් හුස්ම හෙළන තෙක්ම ඒ කාරිය දිගටම කරගෙන ගියේ ය.

ඔහු වෘත්තිකයකු හැටියට පුවත්පත් ලොවට සම්බන්ධ වූයේ 18 වැනි වියේදී ය. ලංකා කොමියුනිස්ට් පක්ෂයේ පුවත්පත් වූ ජවශක්ති ආරම්භක සංස්කාරක වහයෙනි ඒ. ඒ ගමන ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ ප්‍රථම කතා පරිවර්තක - ලංකා ගුවන් විදුලියේ වැඩ සටහන් සම්පාදක - ලේක්හවුස් ආයතනයේ පුවත්පත් වල සේවය - පණ අදිමින් පැවති ලංකාදීප පුවත්පතට නව පණක් දුන් සංස්කාරක වශයෙන් ද රටට ජාතියට ඉටු කළ සේවය අප්‍රියෙල් 5 වැනි දා හමාර කළ එස් පියසේන රටවල් තුනක සිය හැකියාව ප්‍රදර්ශනය කළ මාධ්‍ය වේදියෙකි. ලේඛකයෙකි. ගුවන්විදුලි ශිල්පියෙකි. ඒ අතින් ඔහුගේ උසස්ම සේවය ඉටු වූයේ සමස්ථ ඉන්දියා ගුවන්විදුලි සේවයේ සිංහල අංශය භාර වූ ශිල්පියා හැටියට ය.

14 වසරක් තුළ එහි නිරතව සිටි ඔහු බුද්ධගයා - සාංචි බඳු බෞද්ධ මධ්‍යස්ථානවල සිට වෙසක් වැඩ සටහන් සම්පාදනය කොට ශ්‍රී ලංකාවේ ශ්‍රාවකයන් වෙත ගෙන ඒමට ක්‍රියා කළ පළමුවැන්නා වූයේ ය. කල්කටා සරසවියක ඉගෙනීමට ගිය ගමන අතර මග නතර කොට ආපසු පැමිණි ඔහු දෙවැනි වතාවට එහි ගොස් ඒ මෙහෙය හමාර කළේ ඉන්දියාවේ නියෝජ්‍ය ශ්‍රී ලංකා කොමසාරිස් හැටියට ය.

රටවල් තුනක් පුරා පැතිරුණු මෙහෙවරක් ඉටු කළ ඔහු සිංහල - ඉංගිරිසි සහ හින්දි යන භාෂා ත්‍රයම දැන සිටියේ ය.

1922 වසරේ දිනයක පස්දුන් කෝරළයේ දේවහුව නම් ගමේ උපත ලද ශ්‍රී ලාංකිකයා මිය යන විට ඔස්ට්‍රේලියාවේ පුරවැසියෙක් විය. ජීවිතයේ අවසන් අවදියේ වසර ගණනාවක්ම සිඩ්නි නුවර සිය දියණිය සමග වාසය කළ එස් පියසේන සිඩ්නි හා මෙල්බර්න් යන දෙනුවරම සාහිත්‍ය කටයුතු වලට සම්බන්ධව සිටියේ ය. විශේෂයෙන්ම සිංහල ගුවන්විදුලි සේවාවන්ටත් - මෙල්බර්න් ප්‍රකාශන වන පහන - සන්නස - සිහනද - ලක්බිම යන මාසික පුවත්පත්වලට නිතර ලිපි සම්පාදනය කළේ ය.

පහන මාසිකයේ සංස්කාරක මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් ද සිටි ඔහු ශ්‍රී ලංකාවේ පුවත්පත් සමග පැවති සබඳතාව දිගටම පවත්වාගෙන ගියේ ය. ලංකාදීප පුවත්පතට ලියූ ඔහුගේ ලිපි අවසන දක්වාම පාඨකයාට කියවන්නට ලැබුණේ ය.

දිවයිනේ වෘද්ධතම  පුවත්පත් කලාවේදීයා වූ ඔහුට කිහිප වතාවක්ම මේ පිළිබඳ සම්මාන හිමිවූ බව කිව යුතුය. මෙරට ඔහුට පිරිනමන ලද සම්මානය වූ වික්ටෝරියා ප්‍රාන්තයේ ශ්‍රී ලාංකිකයන්ගේ උපහාරය වශයෙන් වූ ඵලකයක් එස් පියිසේන මහතාට පිළිගැන්වීමේ භාග්‍යය මට ලැබුණේ 2012 පෙබරවාරි 18 වැනි දින පවත්වන ලද මගේ සිවුවැනි පොත් එළිදැක්වීමේ දී ය. ඒ රැස්වීමේ මුලසුන හෙබවූයේද ඔහු ය. ඉන්පසු 2013 සැප්තැම්බර් 22 වැනි දින පැවැත්වුණු මගේ පස්වැනි පොත් එළිදැක්වීම එස් පියසේන මහතා සමග පැවැත්වූ හවුල් පොත් එළිදැක්වීමක් විය.

"දුරාතීතයේ ආවර්ජනා" ග්‍රන්ථය දොරට වැඩියේ එහිදී ය. නිව් සවුත්වේල්ස් ප්‍රාන්තයේ ආදි ආනන්දීන් විසින් ඔහුගේ පොත ළිදැක්වීමේ උත්සවයක් ඉන්පසු පවත්වන ලද බවද කිව යුතු ය. ඔහුගේ අවසන් පොත් එළි දැක්වීම පවත්වන ලද්දේ ආනන්දයේ කුලරත්න ශාලාවේදී ය. එය එම විද්‍යාලයේ ආදි ශිෂ්‍ය සංගමය විසින් සංවිධානය කරන ලද්දක් විය.

නොබෝදා උත්වාකාරයෙන් දොරට වැඩැම්මූ ආචාර්ය රනිල් වික්‍රමසිංහ ගේ චරිතාපදානය ගැන ඇසූ මට සිතුණේ එස් පියසේන වැනි වියතකුගේ චරිත කතාව දේශපාලකයකුගේ චරිතාපදානයකට වඩා රටටත් ජනතාවටත් වැඩදායක නොවන්නේද යන අදහස ය. මා තුළ හටගත් ඒ සංකාව දුරු කිරීමට සමත් සත් ක්‍රියාවක් පෙබරවාරියේ ශ්‍රී ලංකාවට ගිය සිහනද සංස්කාරක විල්ෆ්‍රඩ් සිරිවර්ධන විසින් කරනු ලැබීය. මාධ්‍යවේදී දයා ලංකාපුර අල්ලාගෙන එස් පියසේන චරිතාපදානය සම්පාදනය කිරීමේ වගකීම ඔහුට පැවරීම ය. ඒ පොතේ පිටපත පියසේන මහතා මිය යාමට පෙර අනුමත කිරීමද අපගේ වාසනාවක් ම ය.

# මෙහෙවර අවසන් කර ඔහු යන්න ගියේ ය

**උපේක්ෂා සේනානායක**

"නිර්වර්ණ" වෙත මෙතෙක් මා සැපයූ සෑම තීරු පිලියක්ම ලියා තැබූ කෙටි සටහන් වුවත් මෙවර තීරු ලිපිය ම විසින් ලියනු ලබන්නේ අසීරුවෙන් හා එක්තරා කම්පිත මානසිකත්වයකින් බව ලියා දැක්විය යුතු ය. වසර 94 ක් දීර්ඝායු විඳ ලාංකීය ජන සමාජය වෙනුවෙන් තම පරිණතිය සහ දැනුම අවසන් මොහොත දක්වා බෙදා දුන් ඒ ශ්‍රෙෂ්ට ජනමාධ්‍යවේදියාණන් එස් පියසේනයන් ගේ අභාවය අසා කම්පනයට පත් නොවී සිටිය හැක්කේ කවරකුට ද?

2011 වර්ෂයේ අගභාගයේ එක්තරා සැන්දෑවක ලින්ඩ්හර්ස්ට් හි පදිංචි ඔහුගේ ඥාතිපුත්‍රයකුගේ නිවසේ දී මට ප්‍රථම වරට එස් පියසේනයන් මුණ ගැසුණි. දශක ලණනාවකට පෙර ඉන්දීය මහකොමසාරිස් සේවයේදී ඔහු ලත් අත්දැකීම් මහත් අභිරුචියකින් සිහිපත් කළ ඔහු ඉතා තරුණ වියේ දී ආරම්භ කළ තම මාධ්‍ය මෙහෙවර ස්මරණ ශක්තිය යහපත් තත්වයෙන් පවතින තුරුම තමන්ට හැකි පමණින් ඉටු කරන බව දිදුලන දෑසින් යුතුව කියා සිටියේ ය.  නිසැකවම ඔහු එය ඉටු කළේ ය.  අවසන් වරට මාර්තු 25 වන දා උදෑසන මා අමතන විටත් ඔහු ලෝකයේ දේශපාලන තත්වය ගැන අන්තිම තත්පරයටම දැනුම්වත් වී සිටියේ ය.  එතරම් විශිෂ්ට ස්මරණ ශක්තියක් ප්‍රකට කළ ඔහු සතු වූ දැනුම සහ තොරතුරු සොයා යාමේ මාධ්‍යවේදියකු සතු විය යුතු පිපාසාව නොසිඳී තිබීම මා විශ්මයට පත් කළ කාරණයක් විය.

සුගීෂ්වර දේනාධීරයන් අවසන් වරට මට එවූ විද්‍යුත් ලිපියකට එස් පියසේනයන් ගේ රූපවාහිනී මාධය සාකච්ඡාවක් අමුණා එවා ගිබිණි.  සිය යට රැවුල ඝනව වවා කොණ්ඩය දිගුවන සේ වවා සිටි පියසේනයන් කදිමට තම හඬ පාලනය කරමින් කතා කරනු මම දුටුවෙමි.  සිය ප්‍රතිභාව එළෙසින්ම රැක ගනිමින් ඔහු සිය වයෝවෘද්ධ අවදියේත් මාධ්‍ය මෙහෙයවන අන්දම තරුණ ජනමාධ්‍යවේදීන්ට පාඡම් රැසක් උගත හැකි අවස්ථාවක් වූවා නිසැක ය.  එස් පියසේනයන් මෙල්බර්න් නුවරී සිඩ්නි නුවරත් කඩින් කඩ වාසය කළ සෑම විටකම එතුමා සමග පුවත්පත් සාකච්ඡා කීපයක් කිරීමට තරම් මම භාග්‍යවන්ත වීමි.  එතරම් අපක්ෂපාතී සහ ප්‍රඥාගෝචර ලෙස සිය පෑන මෙහෙයවන ලේකකයකු පුවත්පත් කලාවේදියකු සහ දැන උගතකු අප අතරින් වියෝවීම තීරු ලිපියකින් ලියා නිම කළ නොහැකි පාඩුවක් බව කිව යුතුය.  එස් පියසේනයන් යළි යළිත් අප අතර උපදින්න ඔබ විරාමයක් තබා ගිය ජාතික මෙහෙවර අඛණ්ඩව කරගෙන යාමට. .